## කර්මාන්ත අමාත්‍යාංශය

# ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්

පූර්ණ රජය සතු සමාගමක් වන ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනයෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / (පාලන හා මානව සම්පත්) තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන හා මානව සම්පත්) - Deputy General Manager (Administration & Human reseurces)

### (ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය, HM-1-3)

### පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - පුරප්පාඩු 01

**බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම / අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

පළපුරුද්ද - රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 17 ක පළපුරුද්දක් සමග ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

(ආ) අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

පළපුරුද්ද - රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 17 ක පළපුරුද්දක් සමග ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(2) ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM-1-1) සේවා ගණයෙහි අවම වශයෙන් වසර 02 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(3) කළමනාකාර (MM-1-1) සේවා ගණයේ තනතුරක I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 07 අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

HM-1-3, සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

**වැටුප් කේත අංකය :** HM-1-3, රු. 86,865/-= 2,270X15=120,915/=

රු. 86,865/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටුවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

**වයස් සීමාව -** අවුරුදු 35 නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

ගෙවනු ලබන වැටුපට අමතරව පහත සඳහන් දීමනා හා ප්‍රතිලාභ ද හිමිවේ.

පොදුවේ ගෙවනු ලබන දීමනාවන්ට අමතරව HM-1-3 වැටුප් කාණ්ඩය සඳහා පහත සඳහන් දීමනාද හිමිවේ.

1. මාසිකව ප්‍රවාහන දීමනාව වශයෙන් රු. 50,000/- ගෙවීම හා ඉන්ධන ලීටර 120 සඳහා මුදල් ප්‍රතිපූර්ණය කිරීම.
2. රු. 9,000/- දක්වා සන්නිවේදන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම.
3. කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 05/2017 ප්‍රකාර තනතුරට අදාළ ස්ක්‍රීය සේවා කාලය පදනම් කරගෙන වෘත්තීය දීමනාව ගෙවීම් කරනු ලැබේ.

**පොදු දීමනා**

01. භාණ්ඩාගාරය අනුමත කළ රු. 7,800/- ක් වන ජීවන වියදම් දීමනාව.
02. මාසික ආහාර දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මාසික පැමිණීමේ දිරි දීමනාව දෛනික පැමිණීම මත පදනම් වේ.
04. මසකට රු. 4,000/- වන දුෂ්කර දීමනාව (පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවකයන් සඳහා පමණි)

**ප්‍රතිලාභ**

01. වාර්ෂික නිෂ්පාදන දිරිගැන්වීමේ දීමනාව
02. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)
03. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය
    - i. වසරක් සඳහා රු. 200,000/- ක රෝහල් ගතවීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
    - ii. වසරක් සඳහා රු. 20,000/- ක බාහිර ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
    - iii. වසරක් සඳහා රු. 5,000/- දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුළුව)
04. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබා දීම.
    - i. වසරකට වරක් රු. 5,000/- ක දීමනාව (සාමාන්‍ය වෛද්‍ය ගාස්තු සඳහා)
    - ii. වසර දෙකකට වරක් රු. 12,000/- ක දීමනාව (විශේෂඥ වෛද්‍ය ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ ගාස්තු, ඇස් කණ්ණාඩි හා ශ්‍රවණාධාර වියදම්)
    - iii. දරු උපතක් වෙනුවෙන් වසර 02 කට වරක් රු. 12,000/-
05. මීට අමතරව ස්ථිර සේවකයන් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.
06. සේවකයා විසින් සේවක අර්ථ සාධක අරමුදල් දායකත්වය 10% ක්ද සමාගම විසින් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ආයතනයේ දායකත්වය 3% වේ.

**පොදු කොන්දේසි**

1. සෑම ඉල්ලුම්කරුවෙක්ම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර තම අදාළ දෙපාර්තමේන්තුවල /ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන හා මානව සම්පත්) තනතුර සඳහා වන අයදුම්පත් (අදාළ සහතිකපත්‍රවල ඡායාස්ථ පිටපත්ද සමග) ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර රාජගිරිය, සරණ මාවතේ, අංක 341/21 හි ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් හි, සභාපති වෙත 2021 නොවැම්බර් මස 15 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුවේ.

**සභාපති,**
**ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්,**
**අංක 341/21, සරණ මාවත, රාජගිරිය.**